මධ්‍යම පළාත් ස. .වේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධන අංක 01.

| සංශෝධනය කළ යුතු පවත්නා කොටස් | | ඡේද සංශෝධනය | සංශෝධනයට හේතු |
|---|---|---|---|
| ඡේද අංකය | දැනට පවත්නා පෙළ | | |
| 7.4.2.3 | 7.4.2.3 පළපුරුද්ද: සුදුසුකම් සලකා බලන දිනට මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන නිලධාරී 1 ශ්‍රේණියේ වසර පහ(05) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා 1 ශ්‍රේණියේ වැටුප් වර්ධක පහ(05) ක් උපයාගෙන තිබීම. | 7.4.2.3 පළපුරුද්ද: සුදුසුකම් සලකා බලන දිනට මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන නිලධාරී 1 ශ්‍රේණියේ වසර පහ(05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා 1 ශ්‍රේණියේ වැටුප් වර්ධක පහ(05) ක් උපයාගෙන තිබීම. | සතුටුදායක සේවාකාලයක් යන වගන්තිය ඇතුළත් කිරීම අවශ්‍ය වීම. |

ඇමුණුම 01

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු | ලකුණු ලබා දෙනු ලබන.ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු | |
|---|---|---|---|---|---|---|
| 2.වෘත්තීය සුදුසුකම්<br><br>2.1 ජාතික සමුපකාර සංවර්ධන ආයතනය විසින් පවත්වන ලද කළමනාකරණ/විගණන උසස් ඩිප්ලෝමාව සමත්ව තිබීම හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව/ආර්ථික විද්‍යාව යන විෂයයන් පිළිබඳ ඩිප්ලෝමාවක් සමත්ව තිබීම.<br>- ලකුණු 10යි.<br><br>2.2 දේශීය/විදේශීය පාඨමාලාව-ලකුණු 10යි.<br>(බඳවා ගැනීමේදී සලකා බලනු ලබන මූලික වෘත්තීය සුදුසුකම්වලට හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට අදාළ ඩිප්ලෝමා පාඨමාලාවලට අමතරව හදාරන ලද වෘත්තීය විෂයගත පාඨමාලා)<br>(රාජ්‍යආයතන/NICD/විදේශීය ආයතන)<br>2.2.1. මාස 01ට අඩු පාඨමාලාවකට-ලකුණු 02<br>2.2.2. මාස1-3ත් අතර පාඨමාලවකට-ලකුණු 05<br>2.2.3. මාස3-6ත් අතර පාඨමාලාවකට-ලකුණු 08<br>2.2.4. මාස 6ත් වසර 01ත් අතර පාඨමාලාවකට-ලකුණු10 | 20 | අදාළ නොවේ. | 2.වෘත්තීය සුදුසුකම්<br><br>2.1 ජාතික සමුපකාර සංවර්ධන ආයතනය විසින් පවත්වන ලද කළමනාකරණ/විගණන උසස් ඩිප්ලෝමාව සමත්ව තිබීම හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක සමාජ විද්‍යාව/ආර්ථික විද්‍යාව යන විෂයයන් පිළිබඳ වසර 01කට වැඩි ඩිප්ලෝමාවක් සමත්ව තිබීම. - උපරිම ලකුණු 08යි.<br><br>2.2 දේශීය/විදේශීය පාඨමාලාව- උපරිම ලකුණු 07යි.<br>(බඳවා ගැනීමේදී සලකා බලනු ලබන මූලික වෘත්තීය සුදුසුකම්වලට හා කාර්යක්ෂමතා කඩඉම් විභාගවලට අදාළ ඩිප්ලෝමා පාඨමාලාවලට අමතරව හදාරන ලද වෘත්තීය විෂයගත පාඨමාලා)<br>(රාජ්‍ය ආයතන/NICD/විදේශීය ආයතන)<br>2.2.1. මාස 6ත් වසර 01ත් අතර පාඨමාලාවකට-ලකුණු07<br>2.2.2. මාස3-6ත් අතර පාඨමාලාවකට - ලකුණු 04<br>2.2.3. මාස1-3ත් අතර පාඨමාලවකට-ලකුණු 02<br>(උපරිම සුදුසුකම යටතේ ලකුණු පිරිනැමේ.)<br><br>2.3 මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයෙහි සමුපකාර සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සමුපකාර සංවර්ධන නිලධාරී 1 ශ්‍රේණියට අදාළ III වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමට සහන සලසා ඇති නමුත් එකී සහනය හිමි III කාර්යක්ෂමතා කඩඉමට අදාළ වවන 5000 ක පර්යේෂණ නිබන්ධනය ඉදිරිපත් කර ඉන් සමත් වී ඇති නිලධාරීන් සඳහා - (උපරිම ලකුණු 05) | 20 | අදාළ නොවේ | මධ්‍යම පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන සේවා ගණයෙහි සමුපකාර සංවර්ධන නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 15.2 වගන්තිය යටතේ හිමි සහනය සැලසූ වන නමුත් III වන කාර්යක්ෂමතා කඩඉමට අදාළ වවන 5000 ක පර්යේෂණ නිබන්ධනය 2022.08.12 දින වන විට ඉදිරිපත් කර ඉන් සමත් වී ඇති නිලධාරීන්ට වන අගතිය වැළැක්වීම සඳහා<br><br>ගරු ආණ්ඩුකාරතුමා විසින්<br>[illegible] දින<br>අනුමත කරන ලදී.<br><br>ආණ්ඩුකාර ලේකම් |